# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෝෂ්ඨ විධායක සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා සුරාබදු | යොමු අංකය | : EB/102/අති.සු.කො.ජ./2016 |
| | | දිනය | : 2017.01.23 |
| 1.2 | අමාත්‍යාංශය : මුදල් හා ජනමාධ්‍ය | යොමු අංකය | : MF1/22/Com/EXC |
| | | දිනය | : 2017.03.16 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය | : DMS/1175/111 |
| | | දිනය | : 2016.07.27 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය | : EST-2/04/REC/10105 |
| | | දිනය | : 2017.08.14 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය | : NSCC/3/2/14/SR-2 |
| | | දිනය | : 2017.04.26<br>2017.06.23 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය | : PSC/EST/05-01-02/01/2018 |
| | | දිනය | : 2018.08.28 |

**02. පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ශ්‍රේණිය පිළිබඳ විස්තර**

3.1 සේවා ශ්‍රේණිය : ජ්‍යෝෂ්ඨ විධායක

3.2 ශ්‍රේණි : විශේෂ

3.3 **පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :**

සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන අදාල ආඥාපනත්, අණපනත් හා වෙනත් නියෝග යටතේ නීත්‍යානුකූල සුරා ප්‍රමිති කිරීම් වලින් ලැබිය යුතු සුරාබදු එකතු කිරීම් හා අනවසර සුරා/මත්ද්‍රව්‍ය වැළැක්වීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, විධානය හා තීරණ ගැනීමේ කාර්යයට දෙපාර්තමේන්තු ප්‍රධානියාට සම්බන්ධ වීම.

3.4. **කාර්යයන් පැවරීම** :-

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ශ්‍රේණියට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෝෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.